CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# 2022 අංක 1 දරණ අධි ආරක්ෂක කලාප නියෝගය පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශය

2022 සැප්තැම්බර් 25, (කොළඹ) වර්ෂ 2022 සැප්තැම්බර් 23 වැනි දින ජනාධිපති රනිල් වික්‍රමසිංහ විසින් ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 1 දරණ අධි ආරක්ෂක කලාප නියෝගය ඇතුළත් ගැසට් පත්‍රය පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (Centre for Policy Alternatives - CPA) දැඩි ලෙස ස්වකීය අවධානය යොමු කරනු ලැබේ. මෙම නියෝග / රෙගුලාසි මගින් කොළඹ දිස්ත්‍රික්කය තුළ ප්‍රදේශ කිහිපයක් ''අධි ආරක්ෂක කලාප'' ලෙස නම් කර එම ප්‍රදේශ තුළ ක්‍රියාකාරකම් දැඩි ලෙස නියාමනය කිරීමේ පාලන තන්ත්‍රයක් පනවනු ලබන අතර ඊට අදාළව දඬුවම් සහ දැඩි ඇප කොන්දේසි පනවනු ලබයි.

මෙම නියෝග/රෙගුලාසි 1955 අංක 32 දරණ රාජ්‍ය රහස් පනත යටතේ සම්පාදනය කර ඇත. එම පනත සමීපව නිරීක්ෂණය කිරීමේදී පෙනී යන්නේ මෙම රෙගුලාසි රටේ ආරක්ෂාව සඳහා රහස්‍ය තොරතුරු ආරක්ෂා කිරීම මූලික අරමුණ කරගත් පනතේ විෂය පථයට අයත් නොවන බවයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහිදී මූලික වශයෙන්ම පෙන්වා දෙනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම්වලට පටහැනි වන අතර නියෝග / රෙගුලාසිවල හරය සහ ඒවායේ අරමුණ පැහැදිලි වශයෙන්ම නීති විරෝධී බව පෙන්වා දෙනු ලැබේ. තවද, මෙම මූලික අයිතිවාසිකම් රාජ්‍ය රහස් පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇති රෙගුලාසි මගින් හුදෙක් සීමා කළ නොහැක.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් අත්තනෝමතික ලෙස සීමා කිරීමට, විසම්මුතිය යටපත් කිරීමට සහ රට තුළ භයංකර වාතාවරණයක් ඇති කිරීමට එක්සත් ජාතික පක්ෂ (එජාප) - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු (ශ්‍රීලපොපෙ) ආණ්ඩුව විසින් දරණ උත්සාහයන් මාලාවේ නවතම පියවරක් වශයෙන් මෙම රාජ්‍ය රහස් පනත අපයෝජනය කිරීම පෙන්වාදෙනු ලැබිය හැකිය. තවද, සියලුම ආකාරයෙහි විසම්මුතීන් මැඩපැවැත්වීම සඳහා එක්සත් ජාතික පක්ෂ (එජාප) - ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු (ශ්‍රීලපොපෙ) ආණ්ඩුව විසින් මහජන ආකරක්ෂක නීති භාවිත කිරීමේ ප්‍රවණතාවයට ද මෙකී නියෝග / රෙගුලාසි තවත් එක් නිදසුනක් වේ. රාජ්‍ය පාලනයේ සහ දේශපාලන සංස්කෘතියේ වෙනසක් ඉල්ලා සිටි මාස ගණනාවක් පුරා පැවති පුරවැසි බලමුලු ගැන්වීමේ පසුබිම සලකා බලන කල, මෙකී නියෝග / රෙගුලාසි පැනවීමේ නවතම පියවර සමඟ විසම්මුතිය යටපත් කිරීම සහ ආණ්ඩුව කෙරෙහි ඇති විශ්වාසය තවදුරටත් හීන වීම නිරායාසයෙන්ම සිදු වේ.

ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින අතර, ශ්‍රී ලංකාවේ ආර්ථික බිඳවැටීම නැවැත්වීමට සහ මිලියන සංඛ්‍යාත ශ්‍රී ලාංකිකයන්ගේ පිරිහෙමින් පවතින ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාර කිරීමට ජනාධිපති වික්‍රමසිංහ විසින් නැවත නැවතත් පොරොන්දු දී ඇත. එවැනි සුවිශේෂී තත්ත්වයක් උදා කර ගැනීම සඳහා තම පුරවැසියන්ගේ අයිතිවාසිකම් මෙන්ම නීතියේ ආධිපත්‍යය තහවුරු කරමින් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුවට අනුකූලව ආර්ථික වර්ධනයට සහ ස්ථාවරත්වයට පහසුකම් සලසමින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලන රජයක් අවශ්‍ය වේ. එහෙත්, ස්වකීය මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන පුරවැසියන් ඉලක්ක කර ගැනීම සඳහා මහජන ආරක්ෂක නීති අනිසි පරිදි භාවිත කිරීම මගින් ආණ්ඩුව සහ නීති පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය තවදුරටත් බිඳ වැටීම සිදු වීමට හේතු වනවා පමණක් නොව, ආර්ථිකයේ ප්‍රධාන අංශවල ක්‍රියාකාරිත්වය අඩපණ වීම හේතුවෙන් පවතින අස්ථාවරත්වය සහ අවිනිශ්චිතතාවය තවදුරටත් තීව්‍ර වීමට හේතු වේ. එවැනි සන්දර්භයක් තුළ, මෙම නීති විරෝධී නියෝග/රෙගුලාසි වහා අවලංගු කරන ලෙසත්, විසම්මුතිය අඛණ්ඩව මර්දනය කිරීම නවත්වන ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටී.

අධි ආරක්ෂක කලාප නියෝග අංක 1 හි අඩංගු රාජ්‍ය රහස් පනත සහ රෙගුලාසි පිළිබඳ වඩාත් සවිස්තරාත්මක විමසුමක් වෙත මෙම යොමුව හරහා ප්‍රවේශ විය හැකිය.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org